
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 6 4 6 7 8
LONDON NW3 9LS
E N G L A N D

*Phone* : 0 2 0 7 4 2 8 9 3 8 8
*Fax* : 0 8 7 1 9 0 0 5 1 6 3
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



## එන්න! යාපනයට යන්න!

**ගි**ය සතියේ මම ලංකාවට, මහරගම මගේ මිතුරෙකුට කතාකළෙමි. ඔහු ඊට දින දෙකකට පෙර ගෙදර සියල්ලන් සමග යාපනයේ සංචාරයකට ගොස් පැමිණ සිටියේය. ඉතා සොම්නස් සිතින් හා පුදුමයෙන් යුතුව ඔහු ඒ ගමන ගැන විස්තර කළේය. දැන් ඕනෑම කෙනෙකුට කිසි කරදරයක් නැතිව යාපනයට හෝ නාගදීපය වැඳපුදාගන්නට හැකි වාතාවරණයක් ඇති වී තිබෙන බවත්, උතුරුකරය රජයේ හා හමුදාවේ මැදිහත්වීමෙන් ලබන නවෝදය ගැනත් මගේ මිතුරා දීර්ඝ වශයෙන් විස්තර කරමින් කතාව අවසන් කළේ 'ලංකාවට ආපු දවසක යාපනෙත් ගිහිං එන්න... හරි ෂෝක් ගමන.... ඒ කාලෙ ඒ කරදර දැන් කොහේ ගියාද කියල වත් කාටවත් මතක නෑ... මෙච්චර කල් අපට යාපනේ පෙනුණෙ වෙන රටක් වගේ.... දැන්නම් එහෙම පේන්නෙ නෑ.... හිතෙන්නෙත් නෑ.....'

මගේ මිතුරාගේ කියමන තවත් සැබෑකරමින් පරිගණකය හරහා යාපනයේ ගිය අයගේ විස්තර සටහන් හා පින්තූර ද දැන් දිනපතා අපට ලැබේ. ඒ සියල්ල සංචාරකයින් වන්දනා කරුවන් දිරිගන්වන සුළු ය. මෙය මවාපෑමක් නොව සැබැවින්ම සිදුවන්නක් බව දැන් උතුරේ සිට එන ශුභවාදී පුවත්වලින් වැටහේ. ඇත්තට මේ කුමන වෙනසක්ද?

1983 සිට මේ ගිය අවුරුද්දේ මැයි අන්තිම වෙනකල් යාපනය යනු, යන්න තබා, යන්න හිතන්නවත් බැරිතරම් බියකරු තැනක් විය. එය අපේ රටේම කොටසක් වුවද කොටි ත්‍රස්තවාදීන් හා ද්‍රවිඩ දේශපාලකයන් විසින් ඒ මුළු උතුරම වෙනම කොටුකර උන්ගේ භුක්තියට සවිකරගත්තේය. සිංහලයන් එකෙක් නෑර මරා, තලා පෙලා, පහරදී පන්නා දමන ලදී. යාපනය මුළුමනින් අපෙන් ඈත්වී ගියේය. එහි දෙමළ ජනයාටද සිංහළ මිනිසුන් ආශ්‍රය කරන්නට ඉඩක් නොවීය. එකම රටේ අපි දෙගොල්ල නාඳුනන මිනිසුන් වීමු.

දැන් මේ ඇතිවී තිබෙන වෙනස නිකම්ම ඇතිවුණු වෙනසක් නොවේ. එය කුරිරු ත්‍රස්තවාදයක් පරාජයකොට මුළු රටම එකම කොඩියක් යටතට ගැන්මේ ප්‍රතිඵලයයි. එම කාලකීය වසර 30ක් තිස්සේ කොපමණ දුෂ්කර කටයුත්තක්ව පැවතියේද යන්න අප පුන පුනා විස්තර කිරීම මෙහි දී අනවශ්‍යය. මක්නිසාද කවුරුත් එය හොඳින් දන්නා නිසාය. එහෙත් මතක තබා ගතයුතු දෙයක් නම් ශ්‍රීලංකා සන්නද්ධ හමුදා ත්‍රස්තවාදීන් අභිබවා ලැබූ ජයග්‍රහණය සැබෑ ජයග්‍රහණයක් බවයි. ඒ සැබෑකම කුමක්දැයි මෙසේ පහදා දිය හැකි ය. එනම් මින් මතු කිසියම් ත්‍රස්තවාදියෙකු රජයට එරෙහිව යළිත් ආයුධයක් ඔසවන්නේ නම් ඔහුට ඒගැන වරක් නොව දෙතුන් පාරක් හිතන්නට වෙනවා ඇත.

කුරිරු කොටි ත්‍රස්තවාදය මුළුමනින්ම අවසන්කළ ගිය මැයි මස 18 වෙනිදා ශ්‍රීලංකා ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවේ දී මුළුරට හා සමස්ථ ලෝකයම අමතා කළ කතාවේ ඉතාම වැදගත්ම වාක්‍යය නම් මෙයයි. "<u>මින්මතු මේ රටේ සෑම බිම් අඟලකම බලපවත් වන්නේ, ක්‍රියාත්මක වන්නේ මේ උත්තරීතර සභාවේ නීති රීති අණපනත් පමණයි.</u>" යාපනයේ නව වෙනසට හේතුවද ඒ කාරණයම නොවේද?

# දුකෙන් තොර ජීවිතයකට මග
# The way to happiness



Solitude is happiness for one who is content,
who has heard the Dhamma and clearly sees.
Non-affliction is happiness in the world-
Harmlessness towards all living beings.
- Udana 10

Having killed anger you sleep in ease.
Having killed anger you do not grieve.
The Noble ones praise the slaying of anger
- with its honeyed crest & poison root -
for having killed it you do not grieve.
- Samyutta Nikaya II, 70

Let no one deceive another
or despise anyone anywhere,
or through anger or irritation
wish for another to suffer.
- Khuddakapatha 9

***මෙහි පහත සඳහන් වන්නේ බුද්ධ වචනයි. එය යහපත් ජීවිතයක් ගතකරන්නට ඕනෑම කෙනෙකුට ඉමහත් පිටිවහලක් වෙයි.***

" ධර්මය අසා එය වටහා ගෙන ඒ අනුව කටයුතු කරන්නෝ සෑහීමට පත් නිවී සැනසුණු ඇත්තෝ වෙති. විවේකීව තනිව දිවිගෙවීම ඔවුන්ගේ ප්‍රීතිය වේ. ලොව ජීවත්වන සියළු සත්වයින් වෙත අවිහිංසාව දයාව දැක්වීම, ඔවුනට හිරිහැරයක් නොකිරීම ලෝ තුල්හි සැබෑ ප්‍රීතියට හේතු වන්නේය." - ***උදාන 10***


" සිතින් කෝපය නසා දැමූ කල්හි සුවසේ නිදාගත හැකිය. කෝපය නිවා දැමීමෙන් ඔබ කිසිවිට දුකට පත් නොවේ. එසේ කෝපය වනසා දැමීම ආර්යයන්ගේ ප්‍රශංසාවට ලක්වෙයි. මිහිරි සිරසක්ද, විෂ සහිත මුල් ද ඇති කෝපය නැසීම ගැන ඔබ දුක්වන්නේ නැත."

***-සංයුක්ත නිකාය 11***

" කෙනෙක් තව කෙනෙකු රැවටීමට පත් නොකරත්වා! කෙනෙක් කිසිම තැනකදී තව කෙනෙකු පිළිකුල් නොකරත්වා ! කෙනෙක් කිසිවෙකු කෙරෙහි කෝප යෙන් හෝ නුරුස්නාකමෙන් යුතුව ඒ අයට දුකක් පැමිණෙත්වායි කිසිවිට ප්‍රාර්ථනා නොකරත්වා ! "

***ඛුද්දකපාඨ 9***

# තාක්ෂණය විමුක්තියට බාධාවක්ද?



**න**වීන තාක්ෂණය ( Modern Technology) අද දවසේ ලොව බහුතරයකගේ එදානෙදා ජීවිතයට ඉතා අවශ්‍ය දෙයක්ව පවතී. එය මිනිස් ක්‍රියාකාරකම් පහසු කරනවා පමණක් නොව කාලයද ඉතිරි කරන්නේය. ග්ලෝබල් විලේජ් හෙවත් විශ්ව ගම ලෙස සමස්ථ ලෝකය හඳුන්වන්නට පටන් ගත්තේ මෙම තාක්ෂණ දියුණුව ලොව පුරා සීඝ්‍රයෙන් පැතිරීයාමත් සමගය. අතීතයේ රටවල් බොහෝ දුරින් තිබෙන්නාක් සේ දැනුණේ කමියුනිකේෂන් හෙවත් සංනිවේදනය අද මෙන් පහසු නොවූ නිසයි. එහෙත් අද ඉතා ඈත රටක් වුවද දුරකථන ජාලය ඔස්සේ ළඟටම ගෙන්වා ගත හැකිය. රූපවාහිනී තාක්ෂණයද මෙම විශ්ව ගම්මාන සංකල්පයට ඉමහත් රුකුලක් වීය. ඉන්පසු බිහිවූ පරිගණක අන්තර් ජාල පහසුකම් ඉන් පෙර මිනිසා නොසිතූ විරූ තලයකට සකල ලොව ක්‍රියාකාරකම් අතිශය වේගයකින් ඉදිරියට ගෙන ආවේ ය. එය තවම පටන්ගත්තා පමණි. ලොව කොපමණ වෙනස් වීද! එහි කෙළවර කෙතැනවේදැයි අපට සිතාගත නොහැකි තරම් ය.

තාක්ෂණයට අනුරූපව ලෞකික ජීවිතය පහසු වූ බව සැබෑ නමුත් එයින් ලෝකෝත්තර අංශයේ දියුණුවක් ඇතිවීද යන්න විමසා බැලූ අය සිටිති. සමහරුන්ගේ මතය අවශ්‍ය නම් තාක්ෂණ බල යෙන් විමුක්තිය කඩිනමින් ළඟා කරගත හැකි බවයි. මෙම මතය සාක්ෂාත් කරන්නට දැන් පරිගණක විඩියෝ ක්ලිප් මගින් යෝග ව්‍යායාම් සහ භාවනා ක්‍රම උගන්වන ආයතන තිබේ. ඒ සියළු කටයුතු කෙරෙන්නේ අන්තර් ජාලය මගිනි. විවිධ ආගම් සඳහා එහි ප්‍රචාරක වෙබ් අඩවි ද ඇත.

එහෙත් සමහර පැවිදි උගතුන් කියන්නේ තාක්ෂණය විමුක්තියට බාධාවක් බවයි. ලෞකික දෙයට ඇති ආශාව වැඩිකරන බවයි. ඒ නිසා බොහෝ භාවනා මධ්‍යස්ථානවල රූපවාහිණී නැත. රේඩියෝ පුවත්පත් නැත. දුර කථන නැත. මොබයිල් පෝන් ඒ පළාත කට ගෙන යන්නට තහනම් ය.

♦ ***කීර්ති විතාරණ***
**Bristol UK**

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### ***හිතොපදේශයෙන්***

**ගච්ඡතස් ස්ඛලනං යාති - පදමුද්වහනි පණ්ඩිත:**
**හසනති දුර්ජනා: තත්‍ර - සමාදධති සජ්ජනා:**

***අර්ථය*** : *යමෙකු පිය මනින විට පය පැකිලිල්ලට දුදනෝ සිනහ වෙති. නමුත් සත් පුරුෂයෝ සහන දෙති.*

සමාජ සදාචාරය, මනුෂ්‍ය සහෘත්වය ආදී සමාජ සාරධර්ම සුරකින සුදනන් හා සමාජ වටිනාකම් නොහඳුනන, ඒවා කෙළෙසන, සමාජ පිළිල ලෙස සළකන දුදනන් යන දෙයාකාර පුද්ගලයින්ගේ ගති ලක්ෂණ දෙකක් මෙම පද්‍යයෙන් විස්තර කොට ඇත.

අප ජීවත්වන සමාජය අන්‍යොන්‍ය වශයෙන් එකිනෙකට සම්බන්ධ සමාජ ජාලයක් වශයෙන් පවතී. මෙම සම්බන්ධතාව යම් තැනෙකින් ලිහිල්ව ගියහොත් සමස්ථ සමාජ තලයම දෙදරායාමට පත් වේ. කිසියම් ගෙත්තමක් වියා ඇති නූල එක තැනකින් කැඩී ගියහොත් ඒ නූල ඇදී යාමෙන් අර ගෙත්තම සම්පූර්ණයෙන්ම ලිහී යන්නේය. අප ජීවත්වන සමාජයද සාර ධර්ම නමැති නූල් වලින් වියා, නීති රීති නමැති බැඳීම් වලින් බැඳ ඇති ගෙත්තමකි. එම සමාජ ගෙත්තම ලිහීයාම ඒ සමාජයේ පරිහානියට හේතු වන්නේය.

අප හැමදෙනම සමාජගත පුද්ගලයන් නිසා එකිනෙකා මත යැපීමේ ස්වභාවයක් අප අතර පවතී. අන් අය අමතක කර දමා හුදෙකලා ජීවිතයක් ගතකිරීමේ හැකියාවක් අපට නැත. එසේ කරනවා නම් කළ හැක්කේ යම් ගැටළුවක් පැන නගින තෙක් පමණි. ඉන්පසුව අන් අයගේ උදව් උපකාර අනිවාර්යයෙන්ම ලබාගත යුතු වන්නේය. උදාහරණයක් ලෙස, නිරෝගීව සිටින තාක්කල් කෙනෙකුට බෙහෙත් ආදී වෛද්‍ය උපකාර අවශ්‍ය නොවේ. එහෙත් රෝගී වූ සැණින් ඒවායේ පිහිට පැතීමට සිදුවේ. කෙනෙකු රෝගී නොවන්නේයයි සහතික කිරීමට නොහැකිය.

කුඩා කාලයේ දෙමාපියන්ගෙන් පටන්ගෙන සොයුරු සොයුරියන්, නෑදෑ හිතමිතුරන්, සේවක සේවිකාවන්, ගුරු සිසුන් ආදී වශයෙන් අපි එකිනෙකා හා සම්බන්ධව ජීවත්වන්නෝ වෙමු. ළදරු කාලය හා වැඩිමහළු තත්වයට පත් වූ කාලය අන්‍යයන්ගේ කරුණාව, රැකවරණය උදව් උපකාර ලබා ගැනීමට සිදුවන අතර ඒ අතරතුර කාලය අප විසින් ද අනුනට කරුණාව, රැකවරණය හා උදව් උපකාර ලබාදීමට දීමට යුහුසුළු විය යුතුය.

වරදින මිනිසාට හිනාවීම සමාජයේ බහුලව දක්නට ලැබෙන දෙයකි. තමාගේ වැරදීම සඟවාගෙන අනුන් දෙස විපරමින් බලාසිටින්නේ හිනාවීමටය. වැටෙන මිනිසෙකුට අතදීමට ඉදිරිපත්වන්නේ කලාතුරකිනි. බොහෝ අය කල්පනා කරන්නේ වැටෙන මිනිසා නොනැගිටින ලෙස තවත් පාගා තැබීමටය. අනුන් මුළාකොට විපතේ හෙළා, පහළට ඇද දමන්නට වෙර දරණ අය බහුලය.

නමුත් සත්පුරුෂයාගේ සිත එසේ නොවේ. වැටෙන මිනිසාට හිනාවීම පිළිකුල් කොට ඔහුට අතදීම සත්පුරුෂ ගුණයයි. කරදරයට පත් මිනිසා ඉන් ගොඩගැනීම ඔහුගේ පරම අභිලාෂයයි. වැරදීම, ඇදවැටීම, කටයුතු අඩාලවීම ලෝක ස්වභාවයයි. ඉන් මිදීමට සත්පුරුෂයා උපදෙස් දෙයි. ගොඩ ඒමට අත දෙයි. සෙනෙහසින් මාර්ගෝපදේශය ලබාදෙන සත්පුරුෂ යෝ පරිශ්‍රමයන් හි සෙවනැල්ලක් මෙන් නිබඳ ළඟ සිටිති. සත්පුරුෂයින් ගේ ස්වභාවය එලෙස ය.



♦ **රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති**
***පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි***

**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue, London W4 1UD**

**NORMA & Co**
**Associate Solicitors**

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 020 8348 7772 / 07717173414

Any type of Visa Applications
Car Accidents

***Colombo Office***
Visa Applications & Any Refusals
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632